-

## කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය 2012

---

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දකවා ඇති කරුණු වලින් වන බලපෑම හැර , මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට කැලණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධිත පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම්

##### 1. 2.1 නිරවුල් නොවූ ශේෂ

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2006 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා නිරවුල් නොකරන ලද ප්‍රාග්ධන අත්තිකාරම් රු.172,598 ක්ද 2010 සහ 2011 වර්ෂ වලට අදාලව රදවා ගැනීම් (Retention) රු.73,856 ක් හා ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු 28,000 ක් සමාලෝචිත වර්ෂයේ දී ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) මූල්‍ය තතතව ප්‍රකාශයෙහි ජංගම වත්කම් යටතේ තොග ගැලපුම් ගිණුම ලෙස රු.41,505 ක ශේෂයක් 2007 වර්ෂයේ සිට නිරවුල් නොකර ඉදිරියට ගෙන එමින් තිබුණි.

##### 1.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

සරෙක් (SARAC) ව්‍යාපෘතිය අවසන්වී වර්ෂ ගණනාවක් ගත වී තිබුණ ද එම ව්‍යාපෘතියට අදාලව රු 5,463,897 ක් වූ ස්ථාවර වත්කම් හා, වෙනත් ජංගම වත්කම් යටතේ දක්වා තිබූ රු.5,155,572 ක වටිනාකම සම්බන්ධයෙන් සමීක්ෂණයක් කර එම වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

-

## 1.2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නති,ර්ති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාරව පනවා ඇති 1985 අංක 02 දරන පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය | නියමාවලියෙන් බැහැරව පුරා විද්‍යා පදනම් පාඨමාලාව සහ පුරා විද්‍යා ජෛව විවිධත්වය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව නමින් පාඨමාලාව 02 ක් පවත්වා සමාලෝචිත වර්ෂය තුළ රු.265,250 ක් වියදම් දරා තිබූ අතර රු.547,500 ක ආදායමක් උපයා තිබුණි. |
| (ආ) | 2009 අප්‍රේල් 16 දිනැති හා අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2010 පෙබරවාරි 15 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2010 | පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වුවත්, කාර්ය මණ්ඩලයේ කිසිදු අයෙකු ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | මු.රෙ.371 | කාර්යය නිමකල විගස ලබාගත් අත්තිකාරම් පියවියයුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 12 කදී ලබාගත් සැපයුම් හා සේවා අත්තිකාරම් රු. 237,952 ක් මාස 01 සිට මාස 07 දක්වා ද ප්‍රාග්ධන අත්තිකාරම් රු.315,073 ක් මාස 1/2 සිට මාස 10 දක්වා ද ප්‍රමාදවී පියවා තිබුණි. |
| (ඇ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව කාර්ය මණ්ඩලය සඳහා භාෂා ප්‍රවීණතා දීමනා ලෙස රු.60,035 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | 1997 පෙබරවාරි 03 දිනැති හා අංක 07/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 1997 අප්‍රේල් 01 දිනැති අංක 707 දරන කොමිෂන් සභා චක්‍රලේඛය | 1/20 දීමනාව ගෙවිය හැකි වන්නේ ලිත් මසකට එක් දිනක් සඳහා පමණක් වුවත් ඊට වැඩි දින ගණනකට නිවාඩු දින වැටුප් ගෙවා තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. ඒ අනුව 2012 වර්ෂයට සීමාවන් ඉක්මවා |

-

| | |
|---|---|
| | ගෙවා ඇති මුදල රු.71,696 කි. |
| (ඊ) 2010 නොවැම්බර් 13 දිනැති හා අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා 2010 පෙබරවාරි 24 දිනැති හා අංක 1/ 2010 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | භාවිතා කළ නොහැකි තත්වයේ භාණ්ඩ කඩිනමින් අපහරණය කළ යුතු වුවත් , 2012 දෙසැම්බර් 31 දිනට වූ වත්කම් සමීක්ෂණ වාර්තාවට අනුව ආයතනයේ එක් එක් අංශ වලට අදාලව භාවිත කළ නොහැකි භාණ්ඩ ඒකක 318 ක් අපහරණය කිරීමට 2013 මැයි 03 විගණන දින වන විටත් කටයුතු කර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් ප්‍රතඵලය රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 40,256,445 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,540,333 ක් විය.සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 44,500,000 ක ප්‍රදාන හේතු කොටගෙන එම ඌනතාවය රු.4,243,555ක අතිරික්තයක් දක්වා වර්ධනය වී තිබුණු අතර ඉකුත් වර්ෂය වෙනුවෙන් පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.32,494,457 ක ප්‍රදාන හේතුකොටගෙන එම වර්ෂයේ ඌනතාවය රු.4,045,876 ක දක්වා අඩු වී තිබුණි. ඒ අනුව පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,289,431 ක වර්ධනයක් සඳහා රජයේ දායකය රු.12,005,543 කින් වැඩි වීම විශේෂයෙන් බලපා තිබුණි.

## 3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

### 3.1 <u>අධ්‍යයන කාර්ය සාධනය</u>

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන වර්ෂ කිහිපයක ශිෂ්‍ය ලියාපදිංචිය, අවසන් විභාගයට පෙනී සිටීම සහ විභාග සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

-

(අ) <u>පශ්චාත් උපාධි මට්ටමේ පාඨමාලා පැවැත්වීම</u>

| අධ්‍යයන වර්ෂය | ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව | අතහැර ගිය ශිෂ්‍ය සංඛ්‍යාව | අවසන් විභාගයට පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව* | සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව | අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| 2009/2010 | 93 | 04 | 61 | 53 | 15 |
| 2010/2011 | 114 | 12 | 54 | 51 | 6 |
| 2011/2012 | 174 | 02 | 48 | 44 | 8 |

* දර්ශන විශාරද, දර්ශනපති , විද්‍යාපති / ශාස්ත්‍රපති පාඨමාලා සිසුන් හැර

2011/2012 අධ්‍යයන වර්ෂයේදී පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හා ශාස්ත්‍රපති පාඨමාලා 02 බැගින් ද විද්‍යාපති, දර්ශනපති හා දර්ශන විශාරද පාඨමාලා 01 බැගින් ද පශ්චාත් උපාධි නොවන පාඨමාලා 02 ක් ද පවත්වා තිබූ අතර ලියාපදිංචි වී තිබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 174 ක් විය. 2011 / 2012 අධ්‍යයන වර්ෂ සඳහා පමණක් ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව 53 ක් වන අතර උරුම අධ්‍යනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව සඳහා 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ලියාපදිංචි වී නොතිබුණි.

(ආ) <u>විභාග ප්‍රතිඵල නිකුත් කිරීම් ප්‍රමාද වීම</u>

ආයතනයේ සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද විභාග හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විස්තර පහත දැක්වේ .

| පාඨමාලාව | අධ්‍යයන වර්ෂය | ශිෂ්‍ය සංඛ්‍යාව | විභාග පැවැත් වූ දිනය | ප්‍රතිඵල නිකුත් කල දිනය | ගත වූ කාලය (මාස) |
|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 2012 | 37 | 2012/07/11-12 | 2012/12/05 | 05 |
| කෞතුකාගාර විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | 2012 | 12 | 2012/03/22-23 | 2012/12/05 | 08 |
| | | | 2012/07/12-13 | 2013/02/21 | 07 |
| ශාස්ත්‍රපති (පුරාවිද්‍යා දේශන පර්යේෂණ මගින් ) | 2012 | 24 | 2012/07/24 | 2012/12/05 | 4 1/2 |

| | | | | | |
|---|---|---|---|---|---|
| පුරාවිද්‍යා ජෛව විවිධත්ව පිළබද ඩිප්ලෝමා පාඨමාලාව Diploma in Palaeobiodiverstity part- I | 2012 | 57 | 2012/07/15 | - | ප්‍රතිඵල නිකුත් කර නොමැත. |

සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද එක් එක් පාඨමාලාවන් හි ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා මාස 4 1/2 සිට මාස 08 දක්වා කාල පරාසයක් ගතවී තිබූ අතර පුරාවිද්‍යා ජෛව විවිධත්ව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවෙහි ප්‍රතිඵල මේ දක්වා නිකුත් කර නොතිබුණි.

### 3.2 කලමනාකරණ අකාර්යක්ෂමතා

වාර්ෂික රන් පදක්කම් ප්‍රදානය කිරීමට හා මුදල් ප්‍රදානයන් ලබා දීම සඳහා ආචාර්ය රෝලන්ඩ් සිල්වා විසින් රු.1,000,000 ක මුදලක් 2009 වර්ෂයේ පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයට ලබා දී තිබුණ අතර 2009 ජූනි 16 දින සිට එම මුදල් ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. ඒ වෙනුවෙන් 2012 දෙසැම්බර් 31 වන විට රු.440,322 ක පොලී ආදායමක් ලැබී තිබුණ . අදාල අරමුදලේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ක්‍රමවේදයක් ආයතනය විසින් සකස් කර නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පැරණි කෞතුකාගාර ගොඩනැගිල්ලේ පුනරුත්ථාපන කටයුතු රු.4,460,840 ක කොන්ත්‍රාත් වටිනාකමට ප්‍රදානය කර තිබූ අතර ගිවිසුම අනුව 2011 දෙසැම්බර් 20 දින ආරම්භ කර දින 90 කින් නිමකල යුතු විය. ඒ අනුව 2012 මාර්ත 20 දින වන විට මෙම කාර්යය නිම කළ යුතු වුවද 2012 දෙසැම්බර් 31 දින වන විට ද කටයුතු නිම කර නොතිබුණි . මූල්‍යමය ප්‍රගතිය සියයට 80 ක් වූ අතර භෞතික ප්‍රගතිය පිළිබඳව ප්‍රගති වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය. කාලය දීර්ඝ කර නොතිබුණු අතර ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තුද අයකර නොතිබුණි.

### 3.4 කාර්ය මණ්ඩල පරිපාලනය

විගණනය සඳහා ඉදිරිපත් කල කාර්ය මණ්ඩල වාර්තාව හා ආයතනයේ තථ්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේ දී පහත පුරප්පාඩු පවතින බව 2012.12.31 දිනට නිරීක්ෂණය විය.

| තනතුර | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී | 01 | - | 01 |
| කථිකාචාර්ය (ආධුනික ) | 05 | 04 | 01 |
| කාර්මික නිලධාරී ( ශ්‍රේණිය - i) | 01 | - | 01 |
| කාර්මික නිලධාරී ( ශ්‍රේණිය - ii) | 01 | - | 01 |
| පරිගණක යෙදුම් සහකාර ( ශ්‍රේණිය - iii) | 02 | 01 | 01 |
| | 10 | 05 | 05 |

## 3.5 සේවක පාර්තෝෂික සදහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

2012 දෙසැම්බර් 31 දිනට සේවක පාර්තෝෂික සඳහා ප්‍රතිපාදනය රු.9,425,200 ක් වූ අතර මේ සම්බන්ධයෙන් අරමුදලක් ගොඩනැගීමට කටයුතු කර නොතිබුණි.

## 3.6 සෙමෙන් චලනය වන ශේෂ

රු.1, 425,513 ක් වටිනා ප්‍රකාශන 3112 ක තොගයක් අලෙවි කිරීම සඳහා පුස්තකාලයට භාර දී තිබුණු අතර ඒවා අලෙවි කිරීමේදී ප්‍රදර්ශනය වන ආකාරයට නොතිබුණු බැවින් අලෙවියේ ප්‍රගතියක් දක්නට නොලැබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස් ම

ආයතනයේ 2012-2016 සංයුක්ත සැලැස්ම 2003 ජූනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.1.2 වගන්තිය ප්‍රකාරව පහත අංගයන් ඇතුලත් කර පිළියෙල කර නොතිබුණි.

(අ) ආයතනය සතු සම්පත්

(ආ) ශක්තීන්,දුර්වලතා,බාහිර තර්ජන හා ආයතනය සතු අවස්ථාවන්

(ඇ) පසුගිය වර්ෂ 03 ක මෙහෙයුම් ප්‍රතිඵල

(ඈ) කාර්යසාධන නිර්ණායක

## 4.2 ක්‍රියාකාර් සැලැස්ම

ආයතනයේ 2012 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාර් සැලැස්මට අනුව වර්ෂය තුල ඉටු කල යුතු ප්‍රධාන ක්‍රියාකාරකම් 27 ක් වූ අතර මෙම කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් ප්‍රගතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. සිදු කරන ලද විගණන පරීක්ෂණ වලට අනුව ක්‍රියාකාර් සැලැස්මෙහි වූ අපේක්ෂිත ක්‍රියාකාරකම් 27 න් වර්ෂය තුල සම්පූර්ණයෙන්ම ඉටු කළ ක්‍රියාකාරකම් 10 ක් පමණක් හෙවත් සියයට 37 ක් විය. මේ අනුව කාර්යයන් සියයට 63 ට අධික ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂයේ දී ඉටු කර ගැනීමට නොහැකි වී තිබුණි.

## 4.3 අයවැය ලේඛනමය පාලනය

සමාලොචිත වර්ෂයේ අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් සැසඳීමේදී සියයට 10 සිට සියයට 843 දක්වා පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් වූයෙන් අයවැය ලේඛනය කලමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.4 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ

2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව අයවැය ලේඛනය පිළියෙල නොකිරීම පිළිබඳව පසුගිය විගණන වාර්තා වලින් හා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාවේදී ද අවධානය යොමු කර තිබුණද 2013 ජුනි 25 දින තෙක් එලෙස කටයුතු කර නොතිබුණි

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දෙන ලදී.පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතු වේ.

(අ) පර්යේෂණාධාර ගෙවීම (Research grant )

(ආ) පුස්තකාල පාලනය

(ඇ) ගණුම්කරණය

(ඈ) විවිධ අත්තිකාරම්

(ඉ) ස්ථාවර වත්කම්